“සුනාමියට පෙරහුරුවක් ” සුනාමි ආපදා පෙරසුදානම් පෙරහුරු වැඩසටහන් මාලාවක් මේ දිනවල ක්‍රියාත්මක වේ.

“සුනාමියට පෙරහුරුවක් ” සුනාමි ආපදා අවදානම් පාසැල් සඳහා සුනාමි ආපදා පෙරසුදාම් පෙරහුරු වැඩසටහන මේ මාර්තු මස 01 දින සිට මාර්තු 03 දින දක්වා දකුණු පළාත තුළ සුනාමි ආපදා අධි අවදානම් පාසැල් මුලික කරගනිමින් ක්‍රියාත්මක කරමින් පවතී.

එවැබින් මේ දිනවල සුනාමි ආපදා තත්වයක් පිළිබඳ පූර්ව අවදානම් නිවේදනයක් ඔබ වෙත ලැබුණ හොත් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයෙන් එහි සත්‍ය අසත්‍යතාව විමසන ලෙස ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය මහජනතාවට දැනුම් දෙයි.

මෙම පෙරහුරු වැඩසටහන යටතේ අද (02) දින මාතර මහාමායා විද්‍යාලය, සහ ගාල්ල සුදර්මා මහා විද්‍යාලය යන විද්‍යාලයන්හි පෙරහුරු වැඩසටහන් පැවැත්වූ අතර හෙට දින (03) මාතර කඹුරුගමුව ද්විතීක විද්‍යාලය සහ ගාල්ල මාදම්පාගම මධ්‍යවිද්‍යාලය සහ කුමාර කාශ්‍යප යන පාසල් සඳහා සුනාමි පෙරහුරු වැඩසටහන් පැවැත්වීමට නියමිතය.

අද දින පැවති පෙරහුරු වැඩසටහන සඳහා නිකුත් කරන ලද සුනාමි අවදානම් පිළිබද පූර්ව දැනුම්දීමේ නිවේදනය එම පුහුණු සැසිය සඳහා සහභාගී වු නිළධාරියෙකු විසින් මුහුණු පොතට එක්කර ඇති අතර එය මුහුණු පොත හරහා සංසරණය වී ඇත.

මේ සම්බන්ධයෙන් කළබල නොවන ලෙසත් හුදෙක් මෙය පුහුණු සැසියක් සඳහා නිතුක් කරන ලද සුනාමි පූර්ව අනතුරු ඇගවීමේ නිවේදනයක් පමණක් බවත් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය දැනුම් දේ.

එසේම එවැනි ආපදා පූර්ව අනතුරු ඇගවීමක් පිළබව හෝ යම් අවිශ්වාස පුවතක සත්‍යතාව දැනගැනීම සඳහා 117 දුරකථන අංකයෙන් විමසන ලෙසත් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය දැනුම් දේ.

අද දින එසේ මුහුණු පොතේ සංසරණය වු පූර්ව අනතුරු ඇගවීම් නිවේදනය පහතින් දැක්වේ.

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය
அனர்த்த முகாமைத்துவ நிலையம்
DISASTER MANAGEMENT CENTRE

Vidya Mawatha,
Colombo 07

Your No | My No DMC/08/Drill/2023/(01)09 | 2023.03.02

"අභ්‍යාස සඳහා පමණි"
දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂක,
හම්බන්තොට.

නිකුත්කළ වේලාව : පෙ.ව 11:~~00~~ 02

<u>සුනාමි අවධානම පිළිබඳ විමසිලිමත් වීම</u> වර්ණය : සුදු

ශ්‍රී ලංකාවේ වෙරළබඩ ප්‍රදේශ වල සහ ඒ ආසන්නයේ ජීවත් වන ජනතාව වෙතයි.

ඉන්දියානු සාගරයේ සුමාත්‍රා දිවයින අසල රික්ටර් මාපකාංක 9.2 ක භූ චලනයක් සිදුවී ඇත.

මෙම ප්‍රබලත්වයෙන් යුතු භූ චලනයකින් සුනාමියක් හටගැනීමේ හැකියාවක් පවතින බැවින් ශ්‍රී ලංකාවේ වෙරළබඩ ප්‍රදේශ වල සහ ඒ ආසන්නයේ ජීවත් වන ජනතාව ඒ පිළිබඳ විමසිලිමත් වන ලෙස උපදෙස් දෙනු ලැබේ.

..............................................
හදිසි මෙහෙයුම් මැදිරිය
රාජකාරි භාර නිළධාරී

EXERCISE PURPOSE ONLY
Assistant Director,
Hambantota.

Issued Time : A.M. 11:00

## <u>Tsunami Watch</u>

Colour :- White

**The People Those who are Living Near and along the Coastal Areas Around the Island.**

An Earthquake has occurred near Sumatra Island in the Indian Ocean with these preliminary parameters.

Earthquakes of this size with 9.2 Magnitude and potential to generate ocean-wide tsunamis. Therefore, those living near and along the coast around the Island are advised to be attentive regarding this.

Mrs Anusha

..............................................
EOC Duty Officer

for safer communities and sustainable development


Telephone 2136136 | Fax (Office) 2670079 2670025 | Director General 2670070 2136100
Web: www.dmc.gov.lk Email: info@dmc.gov.lk
Emergency Operations Hotline 2136222/2670002